සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. බෞද්ධ ප්‍රතිපදාවේ දොරටුව වන්නේ,
(1) තෙරුවන් ය. (2) භක්තිය ය. (3) ශ්‍රද්ධාව ය. (4) තිදොර ය.

02. ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු දැන ඇති කරගන්නා පැහැදීම හැඳින්වීම සඳහා යොදා ගනු ලබන්නේ,
(1) අවෙච්චප්පසාදය ලෙස ය. (2) ත්‍රිලක්ෂණය ලෙස ය.
(3) අනිත්‍යය ලෙස ය. (4) පටිච්චසමුප්පාදය ලෙස ය.

03. මා දෙන බතින් යැපෙන මා සපයන යානයෙන් ගමන් යන, මා නිසා ජීවත් වන නමුදු ඔවුහු මා කෙරෙහි ගෞරව නොදක්වා ඔබ වහන්සේ (බුදුරජාණන් වහන්සේ) කෙරෙහි ම ගෞරව දක්වූහ. මෙම ප්‍රකාශයේ දක්වෙන පුද්ගලයන් දෙදෙනා වන්නේ,
(1) ආනන්ද හා අනුරුද්ධ කුමාර වරු ය.
(2) ඉසිදත්ත හා පුරාණ නම් වඩුවෝ ය.
(3) උපතිස්ස කෝලිත මානවකයෝ ය.
(4) ඛරරෝම හා සූචිරෝම යක්ෂයෝ ය.

04. ''අගතිය'' යනු නීතියට, යුක්තියට පටහැනිව ක්‍රියා කිරීම ය. එසේ කිරීමට පාලකයා පොළඹ වන කරුණු හතරකි. එනම්,
(1) ඡන්ද, චිත්ත, විරිය, විමංසා වේ.
(2) මෙත්තා, මුදිතා, කරුණා, උපේක්ෂා වේ.
(3) ඡන්ද, ද්වේශ, භය, මෝහ වේ.
(4) ප්‍රාණඝාත, අදත්තාදාන, කාම මිත්‍යාචාරය මුසාවාදය වේ.

05. බුදු දහමේ අර්ථචර්යාව යනුවෙන් අදහස් කරන්නේ,
(1) අනුන්ගේ යහපත, දියුණුව පිණිස කටයුතු කිරීමයි.
(2) තමන්ගේ යහපත, දියුණුව පිණිස කටයුතු කිරීම ය.
(3) තමාගේ ඥාතීන්ගේ යහපත දියුණුව පිණිස කටයුතු කිරීමට ය.
(4) තමන්ට හා අනුන්ට දියුණුව නොපැතීම ය.

06. බුදුරජාණන් වහන්සේගෙන් වජ්ජි රජ දරුවන් විසින් ඉගෙන ගත් පාලන ප්‍රතිපත්තිය වූයේ,
(1) දස රාජ ධර්ම ය. (2) දස සක්විතිවත් ය.
(3) සතර සංග්‍රහවස්තු ය. (4) සප්ත අපරිහානි ධර්මයන් ය.

07. දස සක්විතිවත් සමස්තයක් වශයෙන් ගත් කල බෞද්ධ රාජ්‍ය පාලනයකින් අපෙක්ෂා කරන වැදගත් කරුණු කීපයක් ඇත. මෙම කරුණු අතර නොගැලපෙන කරුණ තෝරන්න.
(1) ධාර්මික රාජ්‍ය පාලනය කිරීම
(2) අවස්ථාවාදීන්ගෙන් සුදුසු උපදෙස් ලබා ගැනීම
(3) මිනිස් තිරිසන් ආදී සියල්ලන්ට ආරක්ෂාව ලබා දීම
(4) නීති විරෝධී අධාර්මික ක්‍රියා වැළැක්වීම

08. "කවි සිළුමිණ අපේ පැරණි සාහිත්‍යයේ එකම මහා කව වීම නිසා සිංහල සාහිත්‍ය ඉතිහාසයේ ඊට හිමි තැන ද අනිත් කිසිම සිංහල කවි පොතකට නැති තරමින් ඉහළට ගොස් තිබේ." මෙම ප්‍රකාශය කරන ලද්දේ.

(1) මඩවල එස්. රත්නායක මහතා විසිනි. (2) කේ. ජයතිලක මහතා විසිනි.

(3) මාර්ටින් වික්‍රමසිංහ මහතා විසිනි (4) පුංචි බණ්ඩාර සන්නස්ගල මහතා විසිනි.

09. සද්ධර්ම රත්නාවලිය කෘතිය "සද්ධර්මය නැමැති මිණිකැට ඇමිණූ මාලය" නමින් හඳුන්වා තිබේ. මෙම කෘතිය රචනා වූ යුගය හා කතුවරයා වන්නේ,

(1) දඹදෙණි යුගයේ ධර්මසේන හිමියෝ ය.

(2) පොළොන්නරු යුගයේ ගුරුළු ගොමී පඬිතුමා ය.

(3) දඹදෙණි යුගයේ බුද්ධපුත්‍ර හිමියෝ ය.

(4) පොළොන්නරු යුගයේ විද්‍යාචක්‍රවර්තී පඬිතුමා ය.

10. අනුරාධපුර යුගයට අයත් දැනට ශේෂ වී ඇති කෘති වලින් එකක් වන්නේ,

(1) අමාවතුර ය. (2) බුත්සරණ ය. (3) සියබස්ලකර ය. (4) ධර්මප්‍රදීපිකාව ය.

11. ඉන්දියාවේ අජන්තා සිතුවම් වලට නෑකම් කියන, සිතුවම් කලාවේ අපූර්වත්වය පෙන්නුම් කරන, අනුරාධපුර යුගයේ නිර්මාණය වූ චිත්‍ර ඇති ස්ථානය වන්නේ,

(1) මහියංගනය ස්තූපයේ ධාතු ගර්භයේ ය. (2) තිවංක පිළිමගෙය ය.

(3) දිඹුලාගල ලෙන් ය. (4) සීගිරිය ය.

12. මකර මුඛයකින් නිකුත් වන ලියවැලක්, වෘත්තාකාර දඟරයකින් අවසන් වන ලෙස නිමවා ඇති සුලභ කැටයම නම් කර ඇත්තේ,

(1) මුරගල ලෙස ය. (2) කොරවක් ගල ලෙස ය.

(3) සඳකඩ පහණ ලෙස ය. (4) පියගැට පෙළ ලෙස ය.

13. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ අදහසට අනුව සඳකඩ පහණින් අර්ථවත් වන්නේ,

(1) අටලෝ දහමය (2) කර්ම සංකල්පය. (3) භව චක්‍රය. (4) අනිත්‍යතාවය.

14. පොළොන්නරුවේ තිවංක පිළිමගෙය හෙවත් ජේතවනාරාම පිළිමගෙය සෑදූ රජු ලෙස දැක්වෙන්නේ,

(1) නිශ්ශංක මල්ල රජු ය. (2) මහා විජය බාහු රජු ය.

(3) දුටුගැමුණු රජු ය. (4) මහා පැරකුම්බා රජු ය.

15. ගර්භයේ ස්වරූපය අනුව ප්‍රධාන වශයෙන් ස්තූප

(1) සයාකාර වේ. (2) පංචමාකාර වේ. (3) සත්තමාකාර වේ. (4) සිවු ආකාර වේ.

16. භාරතයේ පැවැති කණිෂ්ක රජුගේ අනුග්‍රහය මත පැවැත් වූ සිවුවන සංගායනාවේ මූලිකත්වය දැරුවේ.

(1) පාර්ශව තෙරුන් ය. (2) ධර්මරුචි තෙරුන් ය.

(3) වසුමිත්‍ර තෙරුන් ය. (4) බුද්ධ දත්ත තෙරුන් ය.

17. පුස්තකාරූඪ සංගීතිය පැවැත් වූ කාලය හා ස්ථානය වන්නේ,

(1) ක්‍රි. පූ. දෙවන සියවසේ අනුරාධපුරයේ දී ය.

(2) ක්‍රි. පූ. පළමුවන සියවසේ මාතලේ අලු විහාරයේ දී ය.

(3) ක්‍රි. ව. පළමුවන සියවසේ සීතාවක රාජධානියේ දී ය.

(4) ක්‍රි. ව. දෙවන සියවසේ පොළොන්නරුවේ දී ය.

18. උගුරට ම පිරෙන තුරු ආහාර ගන්නා තැනැත්තා හැඳින්වීම සඳහා යෝග්‍ය සාසනික වචනය වන්නේ,

(1) භුත්තව මිතක (2) කාකමාසක (3) තත්ථාවට්ටක. (4) අලංසාටක

19. පමණ දැන ආහාර ගන්නා ලෙස බුදුරදුන් අවවාද කළ රජු බවට පත්වන්නේ,

(1) අජාසත් රජු ය. (2) බිම්බිසාර රජු ය. (3) සුද්ධෝදන රජු ය. (4) කොසොල් රජු ය.

20. අවේලාවෙහි ආහාර නොගන්නා භික්ෂූන් රෝගී වීම වැළැක්වීම සඳහා කැප සරුප් පාන වර්ග වැළඳීමට අවසර දුන්හ. එය සිවු පසයෙහි,

(1) ගිලන්පස නමින් හැඳින් වේ. (2) චීවර නමින් හැඳින් වේ.

(3) පිණ්ඩපාත නමින් හැඳින් වේ. (4) සේනාසන නමින් හැඳින් වේ.

21. උස් හඬින් කතා කළහොත් බුදුරජාණන් වහන්සේ තම අසපුවට වැඩම නොකරාවි යැයි ප්‍රකාශ කළේ,

(1) අරිට්ඨ නම් පරිවැජියා ය. (2) පොට්ඨපාද පිරිවැජියා ය.

(3) උපක නම් පිරිවැජියා ය. (4) සංජය නම් පිරිවැජියා ය.

22. බුදුරජාණන් වහන්සේ ගේ දේශනා වලට අනුව ශීත වනයෙහි වූ සප්ප සොණ්ඩික පබ්භාරය ද තපෝදාරාමය ද මනරම් ය. තව ද කලන්දක නිවාපි නම් වූ වේලුවනයත් මද්දකුච්ඡි නම් වූ මුව වනයත් සිත් ඇදගන්නා සුළුය. මෙහි කලන්දක යැයි දැක් වූ සතා වන්නේ,

(1) කකුළුවා ය. (2) කුකුළා ය. (3) අලියා ය. (4) ලේනා ය.

23. චම්පා නුවර අසල ගග්ගරා පොකුණ සමීපයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරනු ලැබුවේ,

(1) සිංසපා සූත්‍ර දේශනාවයි. (2) සාමඤ්ඤඵල සූත්‍ර දේශනාවයි.

(3) සෝණදණ්ඩ සූත්‍ර දේශනාවයි. (4) ධනිය ගෝපාල සූත්‍ර දේශනාවයි.

24. බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය ආශ්‍රිතව වස් විසූ සේක. මුවන්ගේ අභය භූමියක් බවට පත්ව තිබූ බරණැස ඉසිපතන මිගදායේ වස් විසූවේ කී වැනි වස් කාලය ද?

(1) පළමු වන වස් කාලය (2) දෙවන වස් කාලය

(3) පස්වන වස් කාලය (4) හයවන වස් කාලය

25. "මේ භූමි භාගය ඉතා රමණීයයි. වන ලැහැබ ඉතාම ප්‍රියජනකයි මනා කොට ඇති සුදු වැලිතලා මැදින් ගලන නදිය ද සිත් සනසන සුළු වෙයි" මෙලෙස පරිසරය වර්ණනාකර ඇති සූත්‍ර දේශනාව වන්නේ,

(1) වේදනා පරිග්‍රහ සූත්‍රයේ ය. (2) අම්බට්ඨ සූත්‍රයේ ය.

(3) අරිය පරියේසන සූත්‍රයේ ය. (4) තේවිජ්ජ සූත්‍රයේ ය.

26. සීල ශික්ෂාවට අයත් නොවන අංගය තෝරන්න.

(1) සම්මා කම්මන්ත (2) සම්මා ආජීව (3) සම්මා වාචා (4) සම්මා වායාම

27. "සම්මා දිට්ඨි" යනු,

(1) චතුරාර්ය සත්‍යය පිළිබඳ ඥානයයි (2) පස්කම් සැපතින් නික්මීම පිළිබඳ සංකල්පනාවයි

(3) සතරාකාර උත්සාහයන් පිළිබඳ වෑයමයි (4) සතරාකාර අනුපස්සනා දියුණු කිරීමයි

28. ලෝකය දුක මත පිහිටා ඇත. ඊට මූලික හේතුව මිනිස් සිත තුළ ඇති අසීමිත

(1) දුප්පත් කම ය. (2) තණ්හාව ය. (3) අකුසල ය. (4) පච්කාර කම ය.

29. විපරිණාම දුක්ඛතා යනු ධර්මයෙහි හඳුන්වා ඇත්තේ

(1) සාමාන්‍ය දුකයි. (2) ඇතිවීම නැතිවීම හේතුවෙන් හට ගන්නා දුක

(3) වෙනස්වීමේ දුකයි (4) වෙනස් නොවීමේ දුකයි

30. අස්සජි මහරහතන් වහන්සේ විසින් උපතිස්ස පිරිවැජිතුමාට කළ දේශනාව වූයේ,

(1) යේ ධම්මා හේතුප්පභවා යන ගාථාවයි.

(2) අක්කොච්ඡි මං අවධි මං යන ගාථාවයි

(3) ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනේ යන ගාථාවයි.

(4) අනිච්ඡාවත සංඛාරා යන ගාථාවයි.

31. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යනු

(1) පඤ්ච ස්කන්ධයයි (2) පඤ්ච නීවරණයයි

(3) පඤ්ච සීලයයි (4) පඤ්චේන්ද්‍රියන් ය.

32. යාදිසං වපතෙ බීජං - තාදිසං හරතේ ඵලං යන්නෙහි තේරුම වන්නේ,

(1) "ගසක් කැපූ විට එය නැවත දළුලයි" යන්න යි.

(2) "පරිසරය සුරැකීම ඔබව රකියි" යන්න යි.

(3) "යම් බීජයක් වපුරා ද, ඒ අනුව ඵල ලැබේ" යන්නයි.

(4) "බීජ වැපුරූ විට සමහරක් පැළ නොවේ" යන්නයි.

33. "කාය කම්ම" සඳහා අදාළ නොවන වරණය තෝරන්න.

(1) ප්‍රාණඝාතය (2) මුසාවාදය (3) අදත්තාදානය (4) කාම මිත්‍යාචාරය

34. චතුරාර්ය සත්‍යය, පටිච්චසමුප්පාදය, ත්‍රිලක්ෂණය, පංචශීලය, සිවු සඟරාවත, සිවුබඹ විහරණ වැනි ඉගැන්වීම් මගින් සමාජයට,

(1) බණ භාවනා කිරීමට මග පෙන්වයි.

(2) අධ්‍යාපනයෙන් ඉහළ ප්‍රතිඵලයක් ලබා ගැනීමට මග පෙන්වයි.

(3) බෞද්ධයෙකු ලෙස ආඩම්බරයෙන් ජීවත් වීමට මග පෙන්වයි.

(4) ජාතික ආගමික සහජීවනය සඳහා කටයුතු කිරීමට මග පෙන්වයි.

35. " සමග්ගා හෝථ මා විවදථ" මෙහි සිංහල අර්ථය,

(1) සමගියම යහපත්ය. (2) සමඟි වන්න විවාද නොකරන්න.

(3) සංවරව කටයුතු කරන්න. (4) නොසන්සුන් බව විවාදයට මුල් වේ.

36. පැවිදි පක්ෂය හය (6) ආකාරයකින් ගිහියන්ට සංග්‍රහ කළ යුතු අතර එම කරුණු වලට අදාල නොවන කරුණ තෝරන්න.

(1) යහපත් ක්‍රියාවල යෙදවීම. (2) පවින් වැලැක්වීම.

(3) සුගතියට මග පෙන්වීම. (4) ආමිසයෙන් සංග්‍රහ කිරීම.

37. සිගාලෝවාද සූත්‍රයට අනුව භෝග විනාශයට හේතුවන කරුණු කීය ද?

(1) 04 කි. (2) 05 කි. (3) 06 කි. (4) 08 කි.

38. පිරිසිදුව කටයුතු කිරීම, කයින් වචනයෙන් හා සිතින් නිදොස් දේ කිරීම, අකුසල් නො කොට කුසල් කිරීම යන අර්ථය දෙන වචනය වන්නේ,

(1) සුචිකම්ම යන්න ය. (2) ධම්මජීවී යන්න ය.

(3) නිසම්මකාරී යන්න ය. (4) සතිමතෝ යන්න ය.

39. තමා විසින් කරන ලද සියලු යහපත් ක්‍රියා සිය පින් පොතෙහි සටහන් කළේ,

(1) මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි. (2) නිශ්ශංක මල්ල රජතුමා විසිනි.

(3) වලගම්බා රජතුමා විසිනි. (4) දුටුගැමුණු රජතුමා විසිනි.

40. සියම් රජතෙමේ සියම් උපාලි මහතෙරුන් වහන්සේ ප්‍රමුඛ උපසම්පදාලාභී භික්ෂූන් වහන්සේලා විසි නමක් (20) ලක් දිවට වැඩම කරවූයේ කවර වර්ෂයේ දී ද?

(1) ව්‍ය. ව. 1795 (2) ව්‍ය. ව. 1753 (3) ව්‍ය. ව. 1744 (4) ව්‍ය. ව. 1763

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය - II** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකය:

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

(01) i. සිදුහත් බෝසතාණෝ කිං කුසල ගවේසීව සිටි සමයේ දී හමු වූ සප්ත සමාපත්තිලාභියා කවුරුන් ද?

ii. පාලි බෝධිවංශය පදනම් කර ගනිමින් රචනා කරන ලද ග්‍රන්ථය නම් කරන්න.

iii. ශ්‍රී ලාංකීය ශාසන ඉතිහාසයේ පළමුවරට පෞද්ගලික ආරාම පූජාවක් සිදු කළ රජු කවුරුන් ද?

iv. "චිත්තං සමේතීති සමථෝ" මෙම පාඨයේ අර්ථය ලියන්න.

v. එංගලන්තයේ පාලි පොත් සමාගම (Pali Text Society) ආරම්භ කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

vi. බුදුරජාණන් වහන්සේ ඇට්ටේරියා වනයක දී දේශනා කළ සූත්‍රය කුමක් ද?

vii. බුදු දහමේ දැක්වෙන සිරිත් හා විරිත් යන්නෙහි අදහස පැහැදිලි කරන්න.

viii. සිදුහත් කුමරුට ශිල්ප ශාස්ත්‍ර ඉගැන් වූ බමුණු පඬිවරයාගේ නම කුමක් ද?

ix. සතර සංග්‍රහ වස්තු නම් කරන්න.

x. පළමු හා දෙවන ධර්ම සංගායනා වලදී දායකත්වය දැක්වූ රජවරු නම් කරන්න.

(ල. 2 × 10 = 20)

02. i. පුද්ගලයාගේ කීර්තිය (යසස) වැඩිමට ඉවහල් වන කරුණු අවධාරණය කරමින් දේශනා කළ ධම්මපද ගාථාව ලියන්න.

ii. ඉහත ගාථාවේ අදහස ලියන්න.

iii. ඉහත ධම්මපද ගාථාවෙන් ලබා දෙන ආදර්ශ ශිෂ්‍ය ජීවිතය හැඩ ගස්වා ගැනීමට ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.

(ල. 02+03+05 = 10)

03. i. ගර්භයේ හැඩය අනුව ස්ථූප ප්‍රධාන වශයෙන් ආකාර හයකට බෙදා දක්වා ඇත. ඉන් දෙකක් නම් කරන්න.

ii. ස්ථූපයක රූප සටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න.

iii. ලොවක් මවිතයට පත් කරන ශ්‍රී ලාංකික කලා ශිල්පීන්ගේ කුසලතා ඇගයීමට ලක් කරන්න. (ල. 02+03+05 = 10)

04. i. ධර්ම සංගායනාවක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි කෙටියෙන් හඳුන්වන්න.

ii. කණිෂ්ක ධර්ම සංගායනාව පැවැත් වීමට හේතු වූ කරුණු ලියන්න.

iii. පුස්තකාරූඪ සංගීතිය (සංගායනාව) ශාසනික වශයෙන් වැදගත් වන අයුරු කෙටියෙන් විස්තර කරන්න. (ල. 02+03+05 = 10)

05. i. ත්‍රි ලක්ෂණය නම් කරන්න.

ii. ඉහත (1) හි දක්වූ කරුණු වලින් එක් කරුණක් පැහැදිලි කරන්න.

iii. අනිත්‍ය හෙවත් වෙනස්වීමේ ස්වභාවය සමස්ථ ලෝකයාටම පොදු වන අයුරු පැහැදිලි කරන්න. (ල. 02+03+05 = 10)

06. i. බෞද්ධ රාජ්‍ය සංකල්ප අතරින් දෙකක් නම් කරන්න.

ii. වජ්ජී රජදරුවන් විසින් ඔවුන්ගේ අභිවෘද්ධිය ඇති කළ පිරිහීම වැළැක් වූ පාලන ප්‍රතිපත්ති හතකි. (7) ඉන් තුනක් ලියන්න.

iii. බෞද්ධ රාජ්‍ය සංකල්පය ධර්මික රාජ්‍ය පාලනයක් සඳහා ඉවහල් වන අයුරු ඇගයීමට ලක් කරන්න.

(ල. 02+03+05 = 10)

07. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

i. වැලිවිට සරණංකර මාහිමි

ii. සද්ධර්ම රත්නාවලිය

iii. පටිච්ච සමුප්පාදය

iv. බෞද්ධ භාවනාව (ල. 05 x 02 = 10)

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව — තෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය — බුද්ධ ධර්මය

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(2) | 4 -(3) | 5 -(1) | 6 -(4) | 7 -(2) | 8 -(4) | 9 -(1) | 10 -(3) |
| 11-(4) | 12 -(2) | 13 -(3) | 14 -(4) | 15 -(1) | 16 -(3) | 17 -(2) | 18 -(2) | 19 -(4) | 20 -(1) |
| 21-(2) | 22 -(4) | 23 -(3) | 24 -(1) | 25 -(3) | 26 -(4) | 27 -(1) | 28 -(2) | 29 -(3) | 30 -(1) |
| 31-(1) | 32 -(3) | 33 -(2) | 34 -(4) | 35 -(2) | 36 -(4) | 37 -(3) | 38 -(1) | 39 -(4) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. ආලාර කාලාම තවුසා
ii. ධර්ම ප්‍රදීපිකාව
iii. වලගම්බා රජතුමා
iv සිත සංසුන් කරන්නේ සමථයයි
v රීස් ඩේවිඩ් පඬිතුමා
vi සිංසපා සූත්‍රය
vii. කළ යුතු දේ නොකළ යුතු දේ
viii. සර්වමිත්‍ර බමුණු පඬිතුමා
ix දානය, ප්‍රියවචනය, අර්ථචරියාව, සමානාත්මතාවය.
x. (1) අජාසත්ත රජු
(2) කාලාශෝක රජු (ල. 2 ×10 = 20)

02. i. උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්ස ච ධම්මජීවිනෝ - අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති (ල. 02)

ii. උට්ඨාන වීර්යයෙන් යුතු, මනා සිහියෙන් යුතු, පිරිසිදු ක්‍රියා ඇති, විමසා බලා කටයුතු කරන, මනා හික්මීමක් ඇති, දැහැමින් ජීවත්වන, නොපමාවුවන්ගේ යසස වැඩේ. (කරුණු 05 ක් ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.)

iii. උට්ඨානවතෝ, සතිමතෝ, සුචිකම්ම, නිස්සම්මකාරි සඤ්ඤත, ධම්මජීවී, අප්පමත්ත, ඉහත කරුණු විස්තර කරමින් ද යසස් වර්ධනය ධන ධාන්‍ය භෝග සම්පත් ලැබීම, වැඩි දියුණුව, කීර්ති ප්‍රසංසාව ද වැඩි දියුණු වීමය. එසේ හැඩගැසෙන ශිෂ්‍යයන්ට අවශ්‍ය ආදර්ශ ගාථා ධර්මයෙන් සපයයි. ඉහත පරිදි පිළිතුර ගලපා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ල. 05)

03. i. ගර්භයේ හැඩය අනුව ස්ථූප හයකට බෙදා දක්වේ.

01. සණ්ඨාකාර - ගණ්ඨාරයක (සීනුවක) හැඩය ඇති
02. ඝටාකාර - කළයක හැඩය ඇති
03. බුබ්බුලාකාර - දියබුබුලක හැඩය ඇති
04. ධාන්‍යාකාර - ධාන්‍ය ගොඩක හැඩය ඇති
05. පද්මාකාර - පියුමක හෙවත්, නෙළුම් මලක හැඩ ඇති
06. ආමලකාකාර - නෙල්ලි ගෙඩියක හැඩය ඇති (ල. 02)

ii.




(ල. 03)

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

iii. ලොවක් මවිතයට පත් කල ශ්‍රී ලාංකික කලා ශිල්පීන්ගේ විශිෂ්ට වාස්තු විද්‍යාත්මක නිර්මාණ අතර ස්ථූප, බුද්ධ ප්‍රතිමා, චිත්‍ර, මූර්ති කැටයම්. ගෘහ නිර්මාණ, සඳකඩ පහණ, මුරගල, කොරවක්ගල, දෙස් විදෙස් සියලු දෙනාගේ ඇගැයීමට බඳුන් වන සුවිශේෂී නිර්මාණ බව පෙන්වා දිය හැක. ඉහත නිර්මාණ පිළිබඳව අවධානය යොමු කරමින් පිළිතුරු සපයා ඇති නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ල. 05)

04. i. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා පනවන ලද විනය රහතන් වහන්සේලා හෝ භික්ෂූන් වහන්සේලා එක්රැස් වී සජ්ඣායන කිරීම. (ල. 05)

ii. 1. සංඝ සමාජය නිකාය වශයෙන් බෙදී ඒ ඒ නිකාය විසින් විවිධාකාරයෙන් බුදු දහම විවරණය කිරීම

2. ත්‍රිපිටක පොත් පත් එක් රැස් කිරීම හා ඒවාට සර්වස්තිවාදී ධර්මයට අනුව අටුවා සම්පාදනය කිරීමේ අවශ්‍යතාවය. (ල. 03)

iii. දීර්ඝ කාලයක් ත්‍රිපිටක ධර්මය මුඛ පරම්පරාවෙන් වාචොද්ගතව පවත්වා ගෙන ඒම නිසා එහි යම් විකෘතිතාවයක් ම ඇති වීමට තිබූ ඉඩකඩ මග හැරීයාම.

රට තුළ පැවැති බාහිර හා අභ්‍යන්තර අවුල් වියවුල් බැමිණිතියා සාගතය, භික්ෂූන් උපැවිදිවීම, භික්ෂූන් වහන්සේලා නිකායාන්තර ලෙස බෙදී විවිධ මතවාද පිහිටා ධර්මය විවරණය කිරීම, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම නිසා පැවැති අනාරක්ෂිත බව දුරුවීම. ථේරවාදී බුදු දහමේ පැවතීමට තිබූ අන්තරායකාරී තත්වය දුරු වී ථේරවාදී බුදු දහමේ පැවැත්ම සහතිකවීම. ආදී තොරතුරු ඇතුලත් වී නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(ල. 05)

05. i. අනිත්‍ය ලක්ෂණය, දුක්ඛ ලක්ෂණය, අනාත්ම ලක්ෂණය (ල. 02)

ii. **අනිත්‍යය** - අනිත්‍ය නම් ලොව පවත්නා සියල්ල වෙනස් වීමය කිසිවක ස්ථිර බවක් නැත.

**දුක්ඛ** - සසර පැවැත්ම මූලිකව දුක් සහිතව ඉපදීම දුකය, මහලුවීම, ලෙඩවීම, මරණය දුක් සහිතය ප්‍රියයන්ගෙන් වෙන්වීම දුකකි. අප්‍රියන් හා එක් වීම දුකකි. කැමැති දේ නොලැබීම දුකකි. මේ අනුව අනිත්‍ය සියල්ල දුක් සහිතය.

**අනාත්ම** - මමය මාගේය යනුවෙන් ගත හැකි ආත්මයක් නැති වීම අනාත්මයයි. බුදු දහමට අනුව පුද්ගලයා යනු පංචස්කන්ධය, ඉන්ද්‍රියන්. ධාතු ආයතන වලින් සැදී පදාර්ථයකි. ආදී ලෙසින් ත්‍රි ලක්ෂණ විස්තර කර තිබීම සම්පූර්ණ ලකුණු ලබා දීමට හේතු වේ. (ල. 03)

iii. සියල්ල අනිත්‍යයි. අනිත්‍ය බැවින් දුක් සහිතය. දුක් සහිත බැවින් අනාත්මය මමය මාගේය නොවේ. ත්‍රි ලක්ෂණය බුදු දහමේ මූලික ඉගැන්වීමකි. දේශය කුමක් වුවද, කාලය කුමක් වුව ද, ත්‍රි ලක්ෂණය ලොව පවත්නා සියලු දෙනාටම බලපායි.

ත්‍රි ලක්ෂණය ලොව පවතින විශ්ව සාධාරණ ධර්මතාවය එය දේශ කාල වශයෙන් වෙනස් නොවන සත්‍යයකි. ලොව පවත්නා සියල්ලෝ දුකට පත් වේ. වෙනස් වීමට හේතු වේ. මරණයට පත් වේ. ඇති වූ සියල්ල තුනී වන හේතු ඵලවාදී සත්‍යයෙන් කවරකුට හෝ ගැලවිය නොහැක මෙය ලෝකයාව පොදු සනාථන දහමක් වන්නේ ඒ නිසාය. (ල. 05)

06. i. දස සක්විති වත්, සප්ත අපරිහාණි ධර්ම

සතර සංග්‍රහ වස්තු

සතර අගතියෙන් තොරවීම

ඉහත කරුණු වලින් 02 ක් ලියා ඇත්නම සම්පූර්ණ ලකුණු හිමි වේ. (ල. 02)

ii. 1. නිතර නිතර රැස්වීම 2. සමගිව රැස්ව, සමගිව සාකච්ඡා කර සමගිව විසිර යාම

3. නොපැනවූ නීති නොපැනවීම පන වන ලද නිති කඩ නොකිරීම

4. වැඩිහිටියන්ට ගරු කිරීම සැලකීම 5. කාන්තාවන්ට ආරක්ෂාව ලබා දීම

6. වජ්ජී රාජ්‍ය තුල හා පිටත පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම හා කඩ නොකර පුද සිරිත් පැවැත්වීම

7. තම රාජ්‍යයට පැමිණි හා පැමිණෙන පූජනීය උතුමන්ට පහසුකම් සැලකීම. (ල. 03)

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

iii. ධාර්මික රාජ්‍ය පාලනයක් පවත්වා ගැනීමට බුදු දහමින් ලබාදුන් උපදේශ බුද්ධ කාලයේ දී බිම්බිසාර රජු, කොසොල් රජු පාලකයන් ද වජ්ජි, මල්ල වැනි සමූහාණ්ඩු පාලකයන් ද අනුගමනය කළ බව පෙනේ. පසුකාලින භාරතයේ ධර්මාශෝක රජතුමාද ලක්දිව බොහෝ රජවරුන් ද දස සක්විතිවත්, සප්ත අපරිහානි ධර්ම, සතර සංග්‍රහ වස්තු අනුගමනය කල් බවත් සතර අගතියෙන් වෙන්ව ක්‍රියා කල බවත් තම රාජ්‍යයන්හි පරිහාණිය වලක්වා අභිවෘද්ධියට පත් කර ජනතාවට යහපතක් උදා කර දී ඇත. රාජ්‍ය පාලනය පිළිබඳ බුදු දහමේ ඉගැන්වීම් වර්තමාන ලෝකයට හොඳ මග පෙන්වා දීමකි. බෙහෙවින් සමාජ හිතකාමී ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය පාලනයක් ක්‍රියාවට නැගීමටත් සංවර්ධනයක ඇති කර ලීමටත් මෙම මග පෙන්වා දීම් වර්තමානයට ද බෙහෙවින් ඉවහල් වේ. (ල. 05)

07. i. ක්‍රි. ව. 1698 ජූනි 18 දින තුම්පනේ වැලිවිට ගමේ කුලතුංග බණ්ඩාර නමින් උපත ලැබීය. වයස අවු. 16 එනම් 1614 දී වැලිවිට සරණංකර නමින් පැවිදි විය. ශාසනික පිරිහීමක් තිබූ යුගයක දුර බැහැර ගෙවා පාලි භාෂාව ධර්ම විනය දුෂ්කරතා මධ්‍යයේ ඉගෙනීම ලැබීය. අල්පේච්ච සරල ජීවිතයක් ගෙවමින් පිණ්ඩපාතිකව වැඩ සිටි නිසා පිණ්ඩපාතික සරණංකර හිමි නමින් ද දුසිල්වතුන් සිල්වත් කිරීමට සිල්වත් සමාගම, ආරම්භ කළේය. සියමෙන් යලි උපසම්පදාව ගෙන්වා, යලි මෙරට උපදම්පදාව ආරම්භ කරමින් 1753 ද උපසම්පදාව ලැබීය. සංඝරාජ පදවිය ලැබීමෙන් පසුව උඩගු නොව මහණ යන්න ලියා තබමින් ආදර්ශයට පත්විය. මුණි ගුණා අලංකාරය සාරාර්ථ සංග්‍රහය.

රත්නත්‍රය ප්‍රණාම ගාථා සන්නස, සතර බණවර සන්නස උන්වහන්සේ ලැබූ පොත් අතර විය. 1778 ඇසල පොහෝ දින උන්වහන්සේ අපවත් විය.

ii. සද්ධර්මරත්නාවලිය

'සද්ධර්මය නම් මිණිකැට ඇමිණූ මාලය' යන අරුත ගෙන දෙන 'සද්ධර්මරත්නාවලිය' ධර්මසේන හිමියන් ගේ නිර්මාණයකි. ගැමි වහරට සමීප වූ උපමා උපමය බහුල යොදා ගනිමින් චරිත හා අවස්ථා නිරූපණය අතිවිශිෂ්ඨය ගැමි ජනයාට සමීප වහරකින් කථා රීතිය යොදා ගැනීම කතුවරයාට ආවේණික ලක්ෂණයකි. පාල ධම්මපදට්ඨ කථාව ඇසුරෙන් රචනා කළ ද එය මෙරට ගැමි හදවත් තුලට සමීප කරලීමට ධර්මසේන හිමියන්ට හැකිවූයේ ගැමි ජීවිතයෙන් ලද අත්දැකීම් නිසාමය.

සද්ධර්ම රත්නාවලියේ පිටු අතරින් මතු වන්නේ පුස්කොළ පොත් සුවඳ නොව ගැමි ජීවිතයේ සුවඳයි.

iii. පටිච්චසමුප්පාදය

'හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති' පටිච්චසමුප්පාද දහමින් සහේතුක බව, හේතු සහිත බව අහේතුක නොවන බවත් ලොව සියලු දේ හේතු ප්‍රත්‍ය නිසා හටගන්නා බව කියැවේ.

යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථා ගතෝ ආහ' හේතුවකින් හටගන්නා යම් ධර්මතාවයක් වේද එය හේතුව නැතිවීමෙන් හැකි වේ. යනුවෙන් තථාගතයන් වහන්සේ දක්වා ඇත.

පටිච්චසමුප්පාද න්‍යාය කෙටියෙන් මෙසේ ද දැක්විය හැක ඉමස්මිං සති ඉදං හෝති - මෙය ඇති කල්හි මෙය වේ. ඉමස්ස උප්පාදා, ඉදං උප්පජ්ඣති - මෙය ඉපදීමෙන් මෙය උදේ ඉමස්මිං අසති ඉදං න හෝති - මෙය නැති කළ මෙය නොවේ. ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති - මෙය නැති වීමෙන් මෙය නැති වේ.

iv. 'භාවේති කුසල ධම්මේ ආසේවති වඩ්ඪේති ඒතායතාති භාවනා' කුසල් දහම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාවයි.

බෞද්ධ භාවනා ක්‍රම 2 කි. එනම් සමථය හා විදර්ශනාවයි. 'චිත්තං සමෙතීති සමථෝ' සිත සන්සුන් කරන්නේ සමථයයි. මේ නිසාම චිත්ත භාවනාව නමින් ද සමාධි භාවනාව නමින් ද හඳුන්වයි. සමථ භාවනාව වඩන්නෙකුට තමාගේ චරිතයට අනුව කර්මස්ථාන හතලිහකි. සතර ඉරියව්වෙන් ම සිට භාවනාවට යොමු විය හැකිය. සමථ භාවනාවෙන් පංච අභිඥා, අෂ්ට සමාපත්ති ලැබිය හැක.

විපස්සනා භාවනාව, විදර්ශනා භාවනාව, ප්‍රඥා භාවනාව හෙවත් නුවණ දියුණු කරන භාවනාවේ උසස් ම ඵලය නිවන් අරමුණට ලඟා වීමය. විදර්ශනා භාවනාවේ දී යථාර්ථය මනා නුවණින් විශේෂයෙන් දැකීම සිදුවේ. එනම් ඇත්ත ඇති ලෙස දැකීමය. "විසේසේන පස්සතීති විපස්සනා" ලෙස දක්වා ඇත්තේ එබැවිනි. මෙම භාවනාව බුදු දහමට ආවේණික එකකි. එය නිවනට හේතු වේ. (ල. 5 × 2 = 10)